# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1655/5 - 2010 මැයි 24 වැනි සඳුදා - 2010.05.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ කුරුණෑගල මහනගර සභාවේ නියෝජ්‍ය නගරාධිපති ධුරයේ පුරප්පාඩුව පිරවීම**

පාර්ලිමේන්තුවට තේරී පත් වීම හේතු කොටගෙන කුරුණෑගල මහනගර සභාවේ නියෝජ්‍ය නගරාධිපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65අ(1) වැනි වගන්තිය යටතේ නියෝජ්‍ය නගරාධිපති වන අබයසිංහ අශෝක් නම් වූ නියෝජ්‍ය නගරාධිපති අයත් වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහක (30) කාල පරිච්ඡේදයක් ඇතුළත නියෝජ්‍ය නගරාධිපති වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ කුරුණෑගල මහනගර සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කර ඇති හෙයින් ද ;

ඉහත කී දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා අනුරාධ ගාමිණී පෙරමුණගේ මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

කුරුණෑගල මහනගර සභාවේ තේරීම්භාර නිලධාරි ආර්. එම්. ඒ. එල්. රත්නායක වන මම, ( 262 වැනි අධිකාරය වූ ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, අනුරාධ ගාමිණී පෙරමුණගේ මහතා කුරුණෑගල මහ නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ආර්. එම්. ඒ. එල්. රත්නායක,
තේරීම්භාර නිලධාරි,
කුරුණෑගල මහනගර සභාව.

2010 මැයි මස 18 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
කුරුණෑගල.

06-152

1A - G 12879 — 360 (2010/05)

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ කල්මුනේ මහනගර සභාවේ සභිකයකුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහෝසි වීම හේතු කොටගෙන කල්මුනේ මහ නගර සභාවේ සභිකයකුගේ ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

2007 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම (සංශෝධනය) පනතින් සංශෝධිත 65අ(2) වැනි වගන්තිය යටතේ ප්‍රතිපාදන සලසා ඇති පරිදි ආදම්බාවා සාකිර් උසයින් නම් වූ සභිකයා අයත් වන ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය නම් වූ දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහක් (30) කාල පරිච්ඡේදයක් ඇතුළත කල්මුනේ මහනගර සභාවේ සභිකයෙකු වශයෙන් පත් කිරීම සඳහා අඥාපනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තෙකු නාම යෝජනා කිරීම, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු වන ආදම්බාවා ජලාල්දීන් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

කල්මුනේ මහනගර සභාවේ තේරීම්භාර නිලධාරි එම්. එම්. එස්. කේ. බණ්ඩාර මාපා වන මම, ( 262 වැනි අධිකාරය වූ ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ආදම්බාවා ජලාල්දීන් මහතා කල්මුනේ මහනගර සභාවේ සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එම්. එම්. එස්. කේ. බණ්ඩාර මාපා,
තේරීම්භාර නිලධාරි,
කල්මුනේ මහනගර සභාව.

2010 මැයි මස 13 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
අම්පාර.

06-153